ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

| 09 ශ්‍රේණිය | නර්තනය I - II | කාලය පැය 02 |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1\. ................................ නැටීමේදී බෙරය වාදනය කරනු නොලැබේ.

I. ගොඩ සරඹ හා දොඹින පද II. පා සරඹ හා ගොඩ සරඹ

III. ඉලංගම් සරඹ හා ගොඩ සරඹ IV. පා සරඹ හා මණ්ඩි පද

2\. මාත්‍රා 2 තනි තිතට හා මාත්‍රා 4 තනි තිතට අයත් වන්නම් දෙකකි,

I. හනුමා,තුරඟා II. හනුමා,සිංහරාජ

III. තුරඟා,යෙරොඩි IV. වෛරොඩි,හනුමා

3\.උඩරට නර්තන සම්ප්‍රදායට යොදාගනු ලබන ගැටබෙරයෙන් වාදනය කරන බීජාක්ෂර වන්නේ,

I. තං,ට,ඩ,රුං II. ති,ටි,රොං,රුං

III. තත්,පිත්,තොං,නං Iv. ගො,රොං,තං,ට

4\.“තෙයියත් තෙයි තා,තිත් තෙයි තත්තා” - මෙය,

I. දහවන පා සරඹයයි. II. හතරවන පා සරඹයයි.

III. හත්වන පා සරඹයයි. IV. හයවන පා සරඹයයි.

5\.“දොදොංත තකු දොං” මෙම බෙර පදය වාදනය කළ හැකි වන්නම වන්නේ,

I. වෛරොඩි II. සිංහරාජ

III. නෛඅඩි IV. තුරඟා

- **අංක 6 සිට 11 තෙක් ඇති ප්‍රශ්න වලට පහත A,B,C,D රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

6\. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ බොහෝ නර්තන අංග ඉදිරිපත් කිරීමේදී අඳිනු ලබන්නේ,

I. **A** රූපයේ රංග වස්ත්‍රාභරණ II. **B** රූපයේ රංග වස්ත්‍රාභරණ

III. **C** රූපයේ රංග වස්ත්‍රාභරණ IV. **D** රූපයේ රංග වස්ත්‍රාභරණ

7. දෙවොල්මඩු ශාන්ති කර්මයේ "දෙවොල් නැටුම" සඳහා අඳිනු ලබන්නේ,

I. **A** රූපයේ රංග වස්ත්‍රාභරණ   II. **B** රූපයේ රංග වස්ත්‍රාභරණ

III. **C** රූපයේ රංග වස්ත්‍රාභරණ   IV. **D** රූපයේ රංග වස්ත්‍රාභරණ

8. **A** රූපයේ දැක්වෙන රංග වස්ත්‍රාභරණ පළඳිනු ලබන්නේ .......................... සම්ප්‍රදායේදීය.

I. උඩරට නර්තනය   II. සබරගමු නර්තනය

III. පහතරට නර්තනය   IV. කථකලි නර්තනය

9. **B** රූපයේ රංග වස්ත්‍රාභරණ පැළඳගෙන නර්තනය කරනු ලබන නර්තන අංගයකි .............................. නර්තනය.

I. දෙවොල්   II. යක්කැනුම

III. තෙල්මේ   IV. දේවකෝල්පාඩුව

10. **C** රූපයට අනුව ......................... ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වේ.

I. ගැට බෙරය   II. යක්බෙරය

III. දවුල   IV. තම්මැට්ටම

11. **A,B,C** රූප සටහන් තුනටම පොදු වූ ආභරණ ලෙස .............................. දැක්විය හැකිය.

I. බන්දි වළලු, කෙමෙත්ත, සිලම්බු

II. ඉනපටිය, ඉන හැඩය, බන්දි වළලු

III. ඉනපටිය, කරමාලය, සිලම්බු

IV. ඉනහැඩය,සිලම්බු, පැතිතරු

12. රස හා භාව පිළිබඳ ............................... නාට්‍ය ශාස්ත්‍රයේ විග්‍රහ කොට ඇත.

I. නන්දි කේශ්වර   II. භරතමුනි

III. ශංකුක   IV. ධනංජය

13. ගැටබෙරයේ කොටස් ලෙස ............................ දැක්විය හැකිය.

I. කැපුම් හම, හැක්ම, වෙනිවර කැරැල්ල

II. කැපුම් හම, ඉල්ලම්, සුරත් තට්ටුව

III. බෙරපුහුල, බෙර තට්ටුව, ඉල්ලම්

IV. බෙර කඳ, බෙර ඇස, කඩිප්පුව

14. පහතරට බෙරයට ........................... අන්වර්ථ නාම භාවිත කරනු ලැබේ.

I. යක් බෙරය, දික් බෙරය, යකා බෙරය

II. රුහුණු බෙරය, විහිඟු බෙරය, දැදුරු බෙරය

III. දෙවොල් බෙරය, යක් බෙරය, රුහුණු බෙරය

IV. ඝෝෂක බෙරය, දෘතහරී බෙරය, මිහිඟු බෙරය

- **අංක 15 සහ 16 ප්‍රශ්න සඳහා පහත A සහ B රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**

15. ගම්පොළ යුගයේදී නර්තන කලාව පැවති බවට ................................. ලී කැටයම් පුරා විද්‍යාත්මක මූලාශ්‍රයකි.

    I. ඇම්බැක්කේ දේවාලය

    II. ගඩලාදෙණි විහාරයේ

    III. ලංකාතිලක විහාරයේ

    IV. බෙන්තර ගලපාත විහාරයේ

16. **B** රූපයේ දැක්වෙන ගල් කැටයම් .................................. දක්නට ලැබේ.

    I. යාපහුවේ දළදා මාලිගයේ පියගැට පෙළෙහි.

    II. නුවර දළදා මාලිගවේ

    III. බෙන්තර ගලපාත විහාරයේ උළුවස්සෙහි

    IV. ඇම්බැක්කේ දේවාලයේ

17. උඩරට වන්නම් ............................... දී ගායනා කරන ලදී.

    I. කවිකාර මඩුවේ

    II. දෙවුන්දර දේවාලයේ

    III. සමන් දේවාලයේ

    IV. දළදා මාලිගාවේ

18. ශෝකය නමැති ස්ථායීභාවය නිසා හට ගන්නේ,

    I. හාස්‍ය රසයයි.

    II. ශෘංගාර රසයයි.

    III. කරුණා රසයයි.

    IV. වීර රසයයි.

19. ගොයම් කැපීමේ නැටුම වේදිකා රංගනයක් වශයෙන් ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිවිය යුත්තේ,

    I. වජිරා චිත්‍රසේනයන් හටය. II. එස්.පණීභාරතයන් හටය.

    III. තිත්තවෙල ගුණයා හටය. IV. කේ.ඇස්.ප්‍රනාන්දු හටය.

20. මානසික ස්වස්ථාව කෙරෙහි ............................ ප්‍රධාන වශයෙන් බලපාන සාධක වේ.

    I. ජීව විද්‍යාත්මක හා ආහාර

    II. ඉන්ද්‍රියන්ගේ චලන සහ පාරිසරික සාධක

    III. නිවසේ පිහිටීම භාෂාව

    IV. ජානමය සහ පාරිසරික සාධක

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. I. කමත් භාෂාවේදී කුල්ල හඳුන්වන්නේ ............................ නමැති පාරිභාෂික පදයෙනි.

II. පන්නෙළීමේ නැටුම සඳහා සාම්ප්‍රදායික ............................ නමැති කාව්‍ය පන්තියේ එන ගීත බහුලව යොදා ගැනේ.

III. උඩරට ගැට බෙරයෙහි දිග ප්‍රමාණය ............................කි.

IV. "ඕවාද සිප්ප දාහේන....." මෙම ගාථාව ............................ නමස්කාර කිරීම සඳහා ගායනා කෙරේ.

V. "උත්සාහ" නමැති ස්ථායිභාවය නිසා ............................ රසය උපදී.

VI. සරඹ නාම අනුව දොළොස්වන පා සරඹය ............................ නමින් හැඳින්වේ.

VII. උපදේශාත්මක ලක්ෂණයෙන් යුක්ත "දුර දිග නොබලා වැඩ කිරීමෙන් කවරකු වුවද විපතට පත් විය හැකි බව" පවසනුයේ ............................ වන්නමෙනි.

VIII. උඩරට අටවන ගොඩ සරඹය ............................ සරඹය ලෙස හඳුන්වනු ලබයි.

IX. ............................ යුගයට අයත් පාල මොට්ටායි ශිලා ලිපියේ මෙරට දේවදාසීන් සිටි බවත්, ඔවුන් නැටුම් ඉදිරිපත් කළ බවත් දැක්වේ.

X. "ලෙලදුන් කව තඹ පලුවන් පාදේ ......" කවියෙන් නළඟනක් රැඟුම් ඉදිරිපත් කර ඇති ආකාරය ............................ සංදේශයෙන් විස්තර කෙරේ.

02. ප්‍රස්තාරකරණය නිවැරදි තාල ලක්ෂනය අනුව සිදුවන ක්‍රියාවලියකි.

I. දෙතිතේ ප්‍රභේද නම් කර, ඉන් එකකට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

II. මාත්‍රා 3 තාලයට පන්නෙළීමේ කවියක් හෝ ගොයම් කැපීමේ කවියක් ප්‍රස්තාර කර දක්වන්න.

III. ඔබ උගත් වෛරොඩි වන්නමේ හෝ සිංහරාජ වන්නමේ අඩව්ව පමණක් නියමිත තාල රූපයට අනුව ප්‍රස්තාර ගත කරන්න.

03. වාදනයේ මූලික හැකියාව සංවර්ධනය කර ගත යුතු වේ.

I. බෙර වාදනයේදී දැනගත යුතු කරුණු 3ක් ලියා, ගැටබෙර කඳ සැකැස්ම සඳහා ගන්නා අමුද්‍රව්‍ය(ලී වර්ග) 3ක් නම් කරන්න.

II. ගැට බෙරයෙන් වයන බෙර සරඹ 2ක් ලියා දක්වා,ගැටබෙරය වාදනය කරන අවස්ථාවන් 4ක් සඳහන් කරන්න.

III. ගැට බෙරයෙහි රූප සටහනක් නිවැරදිව ඇඳ,එහි කොටස් 6ක් නම් කර, බෙරයේ වම් හා දකුණු බෙර ඇස් වලට යොදා ගන්නා සම් වර්ග වෙන් කර ලියා දක්වන්න.

04. නර්තනය ප්‍රගුණ කිරීම සඳහා සරඹ අභ්‍යාස වැගත් වේ.

I. ගොඩ සරඹ 8 හා 9 අයත් පද හා කස්තිරම් ලියන්න.

II. පා සරඹ නිවැරදිව නැටීමට පුහුණුවීමෙන් ලැබෙන ප්‍රයෝජන 3ක් සඳහන් කරන්න.

III. උඩරට පා සරඹ හා ගොඩ අතර වෙනස්කම් 2ක් ලියා, පා සරඹ 10-11-12 පමණක් ලියා දක්වන්න.

05. ගැමි ජනතාවගේ ජීවන වෘත්තියට අදාළව ගැමිකවි ගායනා සැකදී ඇත.

ෂග කඩතුරා කවියක් සහ ගොයම් කැපීමේ හෝ පන්නෙලීමට අදාළ කවියක් ලියන්න.

ෂෂග පන් නෙළීමේ හෝ ගොයම් කැපීමේ ගැමි නැටුමක් නිර්මාණය කරන පිළිවෙළ කරුණු 6කින් පෙළගස්වන්න.

ෂෂෂග ජීවන වෘත්තියකට අදාළ ගැමි නැටුම් 3ක් නම් කර, ඒ සඳහා ගන්නා උපකරණ වල රූප සටහන ඉදිරියෙන් ඇඳ, ගැමි නැටුමක සුවිශේෂ ලක්ෂණ 2ක් සඳහන් කරන්න.